අධ්‍යාපන සමුපකාර සමිතිය
கல்வி கூட்டுறவு சங்கம்
Education Co-operative Society

# පවිත්‍රතා සේවා සැපයීම - මිල ගණන් කැඳවීම

## සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතියේ අංක 294, ගාලු පාර, කොළඹ 03 ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලටත්, මහරගම කාර්යාලයටත් සනීපාරක්ෂක සේවය සැපයීම සඳහා සමාගමක් තෝරා ගැනීම

සීමාසහිත අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතියේ ප්‍රධාන කාර්යාලයේ මහල් 04කින් යුත් ගොඩනැගිල්ලටත් මහරගම පිහිටි දෙමහල් ශාඛා කාර්යාලයටත් වැසිකිළි පද්ධතිය පවිත්‍ර කිරීම, සනීපාරක්ෂාව සැලසීම යන කාර්යයන් සඳහා සුදුසු ආයතනයක් තෝරා ගැනීමට මෙයින් මිල ගණන් කැඳවනු ලැබේ.

- සෞඛ්‍යාරක්ෂිත පිරිසිදුකාරක, ප්‍රමිතිගත නිර්දේශිත රසායන ද්‍රව්‍ය, නවීන උපකරණ සහ උපාංග යොදාගනිමින් සමිතියට ඉහත සේවා සැපයීමට මිල කියැවුම් ලබා දිය යුතුය.
- සතියේ අඟහරුවාදා සිට සෙනසුරාදා දක්වා දිනයන් අනිවාර්ය වැඩ දින වන අතර, සමිතිය දැනුම් දෙන අනෙකුත් දිනයකදී වුවද රාජකාරි සඳහා සේවකයින් යෙදවිය යුතුය.
- අදාළ මිල ගණන් ලබා දීම ආයතන පරිශ්‍රය වෙත පැමිණ පරීක්ෂා කිරීමෙන් පසු මිල ගණන් ලබා දීමට නිකුත් කරන ආකෘති පත්‍රය මගින් සිදු කළ යුතුය. ඒ සඳහා ඉරිදා, සඳුදා දින සහ පෝය හා වෙළඳ නිවාඩු නොවන දිනයන්හි **පෙ.ව. 9.00 සිට 4.00** දක්වා අවස්ථාව තිබේ.
- තෝරා ගන්නා සේවා සමාගම සමිතියට **රු. ලක්ෂයක (රු. 100,000.00)** ආපසු ගෙවනු ලබන තැන්පතුවක් තබා කොන්ත්‍රාත්තුව භාරගත යුතුය.
- **2026-06-20** දිනට පෙර උක්ත මිල ගණන් සමිතියට මුද්‍රා තැබූ පිටපත් 02කින් යුක්තව පැමිණ භාරදීමට හෝ ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු යෙදිය යුතුය. (ලියාපදිංචි කිරීමේ අවසන් දිනය 2026-06-20 ලෙස මුද්‍රාවේ සටහන් විය යුතුය.)
- මෙම මිල ගණන් කැඳවීමේ කාර්යයේ අවසන් තීරණය සමිතිය සතුවන අතර, පහත සඳහන් දුරකථන අංක අමතා වැඩිදුරටත් තොරතුරු ලබා ගත හැක.

**ප්‍රධාන සභාපති**
**සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ**
**සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය,**
**අංක 294, ගාලු පාර, කොළඹ 03.**

**දුරකථන : 011-2266000/078-8651074**